## Abstract 17

# මානව හිමිකම් පිළිබඳ සමයාන්තර දැක්ම

**පූජ්‍ය. ඕපනායක සුසීම හිමි,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර - බෞද්ධ දර්ශනය),
*suseemathero90@gmail.com*

මිනිසෙකු ලෙසින් මෙලොව උපන් සැම අයෙකුට ම හිමිවිය යුතු කිසිදු වරප්‍රසාදයක් කුල ගෝත්‍ර, වර්ණ, භාෂා හා ආගම් වැනි සාධකයන් පදනම් කොටගෙන අහිමි නො කළ යුතු ය. ලොව කොතැනක හෝ එවැන්නක් සිදුවන්නේ නම් එය මානව අයිතීන් උල්ලංඝනය කිරීමකි. එකී උල්ලංඝනය කිරීම උදෙසා මුල් වන ආගමික, දේශපාලනික, සාමාජික ආදි කවර ප්‍රපංචයක් වුව ද නිෂ්ප්‍රභ කළ යුතු වේ. මක්නිසා ද යත්, මානව අයිතීන් උල්ලංඝනය වීම නිසාවෙනි. බටහිර ලෝකය තුළින් ඉස්මතු වූ මෙම ප්‍රස්තුතය ආර්ථික, සාමාජික, ආගමික, දේශපාලනික හා විද්‍යාත්මක ප්‍රවණතාවන් හමුවේ ඉදිරියට පැමිණ ඇත. මානව හිමිකම් ආරක්ෂා කිරීමට ඔවුන් තුළ ප්‍රවණතාවක් ඇතිවූයේ නමුදු එකී පාර්ශ්ව තුළින් ම මානව හිමිකම් කඩකිරීම දැනුවත්ව හෝ නො දැනුවත්ව සිදු වී ඇත. ලොව පුරා මානව හිමිකම් කොමිෂන් සභා, මානව හිමිකම් කමිටු, පරීක්ෂණ මණ්ඩල මෙන් ම තදනුබද්ධ ආයතන හරහා පෝෂණය ලබන බොහෝ අය ද හඳුනා ගැනීමට හැකි ය. මෙහි දී මානව හිමිකම් ක්‍රියාකාරිත්වය උදෙසා සමයාන්තර දැක්ම කෙසේ ද යන්න විමසීමට මේ තුළින් අපේක්ෂා කෙරේ. එයිනුදු ප්‍රධාන ආගම් කිහිපයක් තුළ දැක්වෙන ඉගැන්වීම් පාදක කරගෙන මිනිස් අයිතිවාසිකම් පුද්ගල වශයෙන්, සමාජ වශයෙන් සහ පාරිසරික වශයෙන් ආරක්ෂා කරදීමට කොතෙක් දුරට උත්සාහ ගෙන ඇත්තේ ද යන්නත්, මීට අමතරව එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ මානව හිමිකම් කවුන්සලය විසින් මිනිසාගේ පැවැත්ම සහ ගරුත්වය රැකීම සඳහා 1948 දෙසැම්බර් 10 වෙනි දින ඉදිරිපත් කරන ලද මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය පිළිබඳවත් අවධානයට ලක් කෙරෙමින් සමයාන්තර ආගමික ඉගැන්වීම් සමඟ තුලනාත්මකව සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ.

**ප්‍රමුඛ පද :** මානව හිමිකම්, විශ්ව ප්‍රඥප්තිය, සමයාන්තර ඉගැන්වීම්